**චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය - 2013**

-----------------------------------------------------------------------------------------------------------

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතේ 11(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරික්ෂණයන් මෙම වාර්තාවෙහි දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතෙහි 11 වගන්තිය 3 ඡේදය | ආදායම් හා වියදම් ගිණුමට සහ ශේෂ පත්‍රයට අත්සන් කිරීම මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් මඟින් බලය දෙන ලද මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු අත්සන් කළ යුතු වුවද එසේ කර නොතිබුණි. |
| (ආ) 2002 ජූනි 12 දිනැති අංක පීඑෆ් / පීඊ / 09 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.400,000 ක් වූ ස්ථාවර තැන්පත් ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සංස්ථා භාරයේ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 579,972 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වූ අතිරික්තය රු. 180,328 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 399,644 ක වර්ධනයක් දක්නට ලැබුණි. ආයෝජන වටිනාකම නිවරුදි කිරීම වර්ධනයට හේතු වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**
--------------------------

**4.1** **කාර්ය සාධනය**
------------------

1998 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ වර්ෂ 15 ක් තුළදී චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා විශ්‍රාම වැටුප්, වෛද්‍යාධාර හා මරණාධාර වශයෙන් එකතුව රු. 19,971,980 ක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.
විශ්‍රාම වැටුප් ප්‍රදානය සඳහා සුදුසුකම් ලබන කලාකරුවන් හා කාර්මිකයන් වාර්ෂිකව තෝරාගෙන ඔවුන් විශ්‍රාම වැටුප් අරමුදලට දායක කරගත යුතු වුවද 2005 වර්ෂයෙන් පසු එවැනි තෝරා ගැනීමක් කර නොතිබුණි.

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**
------------------------------------

(අ) **පනතේ අරමුණු සාක්ෂාත් කර නොගැනීම**
----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(I) 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනතේ 3 වන වගන්තියට අනුව භාරයෙහි පරිපාලනය, කළමනාකරණය, සහ පාලනය සඳහා භාරකාර මණ්ඩලයක් පත්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් වාර එකක් පමණක් පවත්වා තිබුණි.

(II) පනතේ 5 වන වගන්තිය යටතේ වූ පහත සඳහන් පරමාර්ථ 2013 වර්ෂයේදීද, ඉටුකර ගෙන නොතිබුණි.

- චිත්‍රපට කලාකරුවන්ට හා කාර්මිකයන්ට ආධාර පිණිස යහසාධක අරමුදල්, ඉතිරිකිරීමේ අරමුදල්, ඉතිරිකිරීමේ හෝ සකසුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

- සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුවන්ට හෝ කාර්මිකයන්ට වයස අවුරුදු 60 එළඹීමෙන් පසු ණයක්, දීමනාවක්, නිවාස පහසුකමක් හෝ වෙනත් සමාන ප්‍රතිලාභයක් පිරිනැමීම.

(III) සංස්ථා භාරයේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කර තිබූ රීති මාලාව අවසාන වරට සංශෝධනය කර තිබුණේ 2003 වර්ෂයේදී වන අතර රු. 2,000 ක් වන මාසික විශ්‍රාම දායක මුදල වර්තමාන තත්ත්වයන්ට ගැලපෙන පරිදි වැඩි කිරීම සහ දායකත්වය සඳහා සුදුසුකම් ලබන මාසික ආදායම් සීමාව වන රු. 3,000 වැඩිකිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) **ක්‍රියාත්මක නොවූ භාරකාර මණ්ඩල තීරණ**
----------------------------------------------------

භාරය සතු ස්ථාවර තැන්පතුවලින් ලැබෙන වාර්ෂික පොළිය හා චිත්‍රපට සංස්ථාවෙන් භාරයට ප්‍රදාන ලෙස ලද රු. 200,000 මුදලින් විශ්‍රාම ලාභීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවනු ලබන අතර, භාරයේ මූල්‍ය තත්ත්වය තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා 2004 සැප්තැම්බර් 21 දින පැවැති 79 වන භාරකාර මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ වැදගත් තීරණ රාශියක් 2013 වර්ෂය දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) රු. 462,778 ක් වූ රුක්මණී දේවි අනුස්මරණ අරමුදල උපයෝගී කර ගෙන ගායකයකුට ඉන්දියාවේ "පූනා" චිත්‍රපට ආයතනයේ පශ්චාත් උපාධියක් ලබාදීම සඳහා යෝජිත ශිෂ්‍යත්ව ක්‍රමය 1985 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------------

5.1 **සංයුක්ත සැලැස්ම**

--------------------

2013 වර්ෂය ඇතුළත් වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.2 **නොවිසඳී ඇති විගණන ඡේද**

------------------------------

1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා කාර්මිකයින් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාර පනතේ 5 වන වගන්තියෙන් දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කළ යුතු රීති මාලාවේ 12 වගන්තිය ප්‍රකාරව අරමුදල වැඩි දියුණු කර ගැනිමට හැකි වන පරිදි මාසිකව ගෙවීමට ප්‍රමාණවත් මුදල් පමණක් රඳවාගෙන ඉතිරි මුදල් ඵලදායී ආයෝජනයක යෙදවිය යුතුය. මාසයක සාමාන්‍ය වියදම රු.100,000 හා රු. 150,000 අතර ප්‍රමාණයක් වූ අතර මාසයකට සාමාන්‍යයෙන් රු. 800,000 ක සිට රු.මිලියන 1 දක්වා වූ අතිරික්ත මුදල් ප්‍රමාණයක් බැංකු ජංගම ගිණුමක රඳවා ගෙන තිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව භාරයේ සභාපතිවරයා වෙත වරින්වර මාගේ වාර්තා මඟින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආයෝජන

(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම